# කතා කරන පින්තූර



සුකිත එස්. බණ්ඩාර

# කතා කරන පින්තූර

වෙනත් කෘති – වළාකුළු බැමි ( කාව්‍ය )

ISBN- 978 – 624 – 208 – 813 - 6

සුබිත එස්. බණ්ඩාර

## පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්නශීලි චින්තනය නිර්මාණාත්මක කුසලතා වලින් සමෝධානික වූ ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වූ භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ.

ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍යය වෙයි ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරාහා සිදුකිරීම වඩත් ඵලදායි වෙයි දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරිමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි.

මෙවර අප පාසලේ ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන් හෙරණ ගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් විම ප්‍රශංසනීය කරුණකි . ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගේ හැඟීමයි .

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර



හැමුවත් සුළං රුදු සත් සමුදුරු කළඹා
කරඬුව දරා මගුළැතු ගමනද අරඹා
ගල් මුල් පෙරළුවත් උන් පෙරහැර නරඹා
ඉවසමු දුවේ එනතුරු සිහිනය පියඹා



හෙළුව කපලා වහපු සුදු රෙදි උඩත් තිබුණා මල් වඩම්
ඊයේ මහ රෑ මැදියමෙත් උන් මූණ ඉම්බා ඇති තරම්
දෙවියො විතරක් බලා සිටියා නිදිමතේ වගේ සිව් වරම්
හෙට උදේ එන දෙවනි ගමනට ආය මොකටද දුක් සුසුම්





අම්ම වාගේම ඉදී කියලා කිව්වෙ නිතරම ගමේ ඔක්කොම
මමත් නිතරම හීන මැව්වා පුතෙක් වෙන්නැති දඟයි කිව්වම
අකුණු ගහ ගහ විදුලි කෙටුවා අව්ව පායපු දවස තිස්සෙම
අකුරු තුනකට හදල තිබුණත් ලියන්නට බැරි උණා උඹෙ නම




**සැඳෑ අඳුරේ ගිලී ඉගිළී සැඟවුණා සියොතුන්**
**නිමාවී යයි තවත් දවසක් දැල්වෙනා පහනින්**
**මීවිතක උණුසුම සොයා යන අවන් හල් අතරින්**
**බිඳෙන් බිඳ දිය කර හරින්නේ ප්‍රේමයේ නටබුන්**



තිමිරය ඉරා විසිකර මිහිදුම් සළුව
නැගළුයි මෝදු වී කන්දෙන් හඳ පළුව
සරතැස නිවා මිණි කිරණක් සේ ගැලුව
අහසින් කඩා වැටුණයි ඉරබටු තරුව




මුතුකැට වගේ ගිළිහෙන කඳුළැළි ධාරා
පවසන රහස් වැළපෙයි නටබුන් පීරා
ආගිය ගමන් මග අප හදවත් පාරා
තවමත් පිපෙනවද සොඳුරියෙ මැයි මාරා



ඉරේ රැස් මැරි මැරී නිවෙන විට පඩුපාට
කණාමැඳිරි අඩනවා අඩු මාසේ පෝයකට
නවම් මහ කෙළවරේ නුඹෙ මතක බණ දාට
හැමදාම කළුවරයි හන්තාන අහස යට



කවුළු අතරින් මිරිකි මිරිකී ඉබා ගාතෙම ගළයි සඳරැස්
කපුටු බෝධිය යටත් විසිරී තිබෙනු දුටුවා රැයේ බුදුරැස්
මී විතක් ඉදහිටක තුරුළුව නිවා දමනා විටක සරතැස්
රාමුවෙන් පිට පනින්නට බැරි අපේ ජීවිත වෙලා හතරැස්



**සිහසුන් කරා වැජඹෙන කල නිළධරයෝ**
**පාවඩ එළති උඩ පැන පැන සොර දෙටුවෝ**
**කලදුටු කලට වල ඉහගති හොරිකඩයෝ**
**පෙරහැර මුලම සිටියේ හොඳ කසකරුවෝ**



මහගෙයි බිත්ති විතරද දන්නේ රැව්ලි
පැණි කැවුමක් පුස් කෑවත් නම කැව්ලි
මල්පල දරන්නට වැළපෙන අතු රිකිළි
සනසා නැළවියන් රන්වන් රන් තොටිලි



**මහමෙර වගේ අරගෙන ගත සිත සවිය**
**නැගගෙන ඇවිත් හෙමිහිට පඩියෙන් පඩිය**
**නොසැලී නොනැවතී පෙරටම ගෙන දිරිය**
**තියපන් දුවේ හරියට අන්තිම අඩිය**



පෙරලා පරණ සැමරුම් නිදහසේ ලිත
බැලුවොත් හැරී අප ලද නිදහසක් නැත
හිඟමන් යදී ලෝකෙට ණය වෙවී සත
සිරිලක් මවට ඇත වැදිලා හතේ හත




පරපුරක් කඹුරලා ඊළඟ පරපුරත් ඇදපු ගෙලේ
චක්‍ර මාලය උරෙන් ගලවා විසි කළත් අපි අඩු කුලේ
රාජකාරිය කෙරෙනතුරු අපි කවුරු කවුරුත් තුන්හෙලේ
තැලෙන ගෙරි හම උඩට වැටුණොත් යහන්ගතවුණු රතුම ලේ



**උපන්දා සිට එකම දවසක් කෙරුවනම් මම පොලිටිකල්**
**රටම හිරිගඬු පිපිලා යන්නට දීලා සීතල පොප්සිකල්**
**ගිමන් හැර හැර මෙහෙම මහමග කකුල් දෙක මගේ ගෙවෙනකල්**
**උඹ තියාගෙන ලැගෙජ් එක උඩ පදින් නෑ මම බයිසිකල්**



කපුටෙක් කියයි ළඟ ළඟ අවුරුදු එන්නේ
මොනවා අරගෙනද මහ ගෙදරට යන්නේ
ඔතලා රිබන් පටියක් හැඩ කරගන්නේ
අරගමු පාන් මොකටද කරදර වෙන්නේ



**සැරසී වැඩට යන්නට හෙට දින මන්ඩේ**
**උස්සා බඳින්නද ගෙඩියක් උඹෙ කොණ්ඩේ**
**කොතරම් හැඩද වෙනදා වාගෙද අණ්ඩේ**
**මැණිකේ නුඹයි මම වෙන්නද සුදු බණ්ඩේ**



බඩ තඩි ඇමතිලා දැන් ඔක්කොම මාරු
දියවන්නාවේ තරගෙට පදිනවා පාරු
දිවි රැකගන්න පුරවා සහලින් සේරු
මොනවා කරන්නද මම ගානවා පෝරු




මහමෙරක් සේ සිතින් විද විද  දෙපැත්තට ඇදි කඹය  කැඩුණායි
ඔබේ දෑසත් මගේ දෑසත් අතර තුන්වෙනි ඇසක් රැඳුනයි
අපේ හදවත් සැළෙන හඩ හැර පූරියේ අන් සැවොම නිහඬයි
භවෙන් භවයට බැඳී අප ආ සසර ගණුදෙණු අදින ඉවරයි




ගල්කණු යටත් මල් පිපෙනා      උදෑසන
මතකය ඉකිබිදී හෙමිහිට      පුරාතන
සරසවි බිමේ මල් මතකය      බදාගන
හඩමුද හමුවෙලා මැඳුරෙද්      සනාතන



පෝරුව උඩදී පළඳා අත පිරිමැද්ද
මැණිකේ අපේ මතකය කොපමණ ඇද්ද
වටපිට බලා රිංගා නොකරම සද්ද
අද මම උකස් තිබ්බා මංගල මුද්ද




මේ අයිලයේ කිසිදින අමතක නොවෙනා
පොප්ලර් ගස් අතර මතකය ඉකිබිඳිනා
මුල් පොත කියා දුන් දුයිෂෙන් නුඹ නමිනා
තවමත් හිඳිමි මග බලමින් අල්තියිනා




වසා දොරගුළු දමා සිරකර මරා දැමූ අප ප්‍රේමයේ
අඳුරු සෙවනැළි අදත් ඇවිදියි එදා මෙන් නෙත් මානයේ
සුවෙන් සැතපෙන සොඳුරු සැමරුම් වැලිතලා යට කාලයේ
දොළොස් වසරක් මැරී ඉපදෙයි පළමු දින මැයි මාසයේ



කණාමැදිරි එළි නිවෙන ගණ අඳුරු කරුවලේ
අද රැඟුම් බලන්නට තනි තනිව අපි වලේ
හන්තාන සෙවනැල්ල පහන්කණු යට දිලේ
ඔබ ඔතන මම මෙතන කෙලෙසෙ අපි වෙන් කලේ



පාන්දර දුම් දදා කොළඹ යන කෝච්චි
වගේමයි උණුසුමට තේ හැදෙන පෝච්චි
රසකැවිලි කඩචෝරු බැදලා දුන් තාච්චි
දකිනවිට මතක් වෙයි කැන්ටිමේ ආච්චි



විසි දෙනෙක් තරඟයට එකම එක කාමරේ
අඩ අඩා ලියනකොට පොලිටිකල් පේපරේ
කල්පනාවක සිටින ඔබ සිහින සාගරේ
දකිනවිට ඇත්තමයි සිතුණි මට ආදරේ



අප්පච්චි අනේ මට ඔනේ පොඩි මල්ලියෙක්
මා එක්ක රණ්ඩුවෙන දඟම දඟ චණ්ඩියෙක්
හැමදාම කියනකොට කොහෙද මට පිළිතුරක්
දුවේ නුඹ දන්නෙ නෑ අපි අතර රණ්ඩුවක්



පෙරලෙන ගලේ කිසිදින නොබැදෙයි පාසී
කාරිය කෙරෙනතුරු අතයට යයි කාසී
අඩුවට අරන් මනිබඩු පැළඳුව රෝසී
කොඩි ගහයට තරඟෙට වෙයි වෙන්දේසි



සංගුව වගේ කැරකෙන ගේ මැද සාලේ
මුරුගන් නුඹත් ඇති උන්ටම දෙන තාලේ
සතයක් නැතිව ලතවෙන මං මේ කාලේ
දෙවියනි අරන් දෙනවද කෙල්ලට මාලේ



අතහැරී මගහැරී සසර සැරි සරණකල්
එක් නොවී වෙන් වෙලා ජීවිතය තියෙනකල්
ලෝකයට සැඟවිලා  බිඳුණ දා ගත්ත සිල්
අතදිගට ගලනවා වරුසාව කෝපි මල්



ගල්ලෙන බිඳින බව ඉඳුරා දැන උනිමි
සුප්පා දේවි අනුබල දුන් බව දනිමි
ලෙන්දොර ඇරෙන තුරු ඉවසාගෙන සිටිමි
සීවලි නුඹත් ගෙන මම ආපසු හැරෙමි



**ඔබ මගෙන් වෙන් වෙලා ගෙවී ගිය දස වසර**
**මහා නුග රුකක් විය වැඩී ගිය අතු පතර**
**හිමි අහිමි ජීවිතේ බොහෝ දේවල් අතර**
**මතකනම් හරියටම එයා දැන් පහ වසර**



**ගෙවී දින සති මාස අවුරුදු වයස දැන්මට හතලිහයි**
**අතැර යන්නට සියලු දේවල් තවත් ඇත්තේ බාගයයි**
**හඩා වැළපෙන මිනිසු අතරේ මතක සැමරුම් කෝටියයි**
**දෑස් පියවෙන දිනක මා ළඟ රැදෙන නුඹ මගේ ප්‍රාණයයි**



නොළැබුනත් සභාවක කිසිමදින ලොකුම පුටු
හදවතේ කොනකවත් තිබුණේ නැහැ හිතක් පටු
තමන් නිවැරදියිනම් බය නොවී ඔහොම හිටු
කියපු නුඹ සොහොයුරෙකි සොහොයුරන් අතර දුටු



ගැබ්බරයි නිල් අහස අකලට වැස්ස නැති ඉල් මහේ
හාදු දෙන දුක හඬා වැළපෙයි අපේ වුණු අප කොහේ
මලක් පිපිලා නමක් දන්නැති තියුණු කටු අග ගහේ
මතක යටකර දෝරේ ගලමින් ගලපුදෙන් ගඟ ඔහේ



යනෙන හැමතැන දෙනෝ දාහක් නුඹට පාවඩ එලනවා
තබන තබනා පයක් ගානේ කිත් යසස් මල් පිපෙනවා
අහස වටකර තාරකා මැද සරා සඳ සේ දිලෙනවා
වැදූ මවමෙන් හැදූ මවටත් ණය ගැතියි මට සිතෙනවා




ඔපකළ මැණික් මුතු අබරණ　　　　අගස්ති
සුසිනිදු සේලයෙන් සැඟවූ　　　　විකෘති
අඳවුණු දෙනෙත් යට බොඳවුණු　　　　ප්‍රකෘති
පැසසුම් පතා මම නොගයමි　　　　ප්‍රසස්ති



ඉඳහිට පෙරළුවත් තනියට පරණ පිටු
හැකිවෙද පිහින්නට ඔමරගේ නහයේ හොටු
රැජිනක් උනත් හිටියලු කීවොතින් හිටු
ගැහුවොත් පිරිමියලු සාරියේ හැඩට කටු




අදත් නුවරට මේ වහින්නේ එදා මල් වැස්සයි
අවන්හල් දොර අත වනන්නේ පුරුද්දට වෙන්නැයි
සේදි සේදී දෝරේ ගැලූවත් කමක් නෑ සත්තයි
මතක අමතක කරන්නට බැරි කෝපි වගෙ තිත්තයි



ඔබෙ මුහුණ මගෙ මුහුණ බදාගෙන උමතුවෙන්
ඔය දෙතොල් පෙති අතර සෙවූ මධු මීවිතෙන්
මත්වෙලා දිනෙන් දින ගිලන්වූ මගෙ සිතෙන්
එකම එක දෙයක් හැර සියලු දේ හැර ගිහින්

මෙහෙම ඉමු ලංවෙලා එකම එක මොහොතක්
වැඩකලා වැඩි වගේ මට පුදුම වෙහෙසක්



ලංවෙන්න තව ටිකක් කියන්නද රහසක්
නිදහසක් නෑ අපිට අද නපුරු දවසක්
මෙහෙම ඉමු ලංවෙලා එකම එක මොහොතක්
වැඩකලා වැඩි වගේ මට පුදුම වෙහෙසක්

**පසුවදන**

**රටක අනාගතය සඳහා මානව සම්පත සුදානම් කිරීමේ වගකීම පැවැරී ඇත්තේ ගුරුවරයාටය . එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය.  ඔවුන් සමාජයේ පෙරගමන් කරුවන් නිසා ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත් කාලීන වීම ද දරුවන්ගේ  පරමාදර්ශී චරිතයක් වීම ද අත්‍යවශ්‍ය වෙයි තමා වෙත පැවැරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ  සමාජ වගකීමයි .**

**මෙම යථාර්ථ පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොට ගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකූර ලෙසින් රෝපණය කරන්නක් විය. ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන කේෂත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීම ට ලැබීම භාග්‍යයකි . මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා සමග පොත් ලියන ‘‘ හෙරණගත්කරණී ’’ ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුනට ද ආදර්ශයකි . ඔබගේ  නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම් ,**

**හෙරණගත්කරණි නිර්මාතෘ**
**සෙනෙවිරත්න මහලේකම්**